සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සංගීතය (පෙරදිග) | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි.
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

(01) භූපාලි රාගයේ වර්ජිත ස්වර දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ග ම (2) ග ධ (3) ම ධ (4) ම නි

(02) සංගීතයේ ප්‍රකෘති, විකෘති, අචල ස්වර ගණන පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) 5 , 5, 2 (2) 7, 5, 2 (3) 5 , 4, 2 (4) 2 , 5, 2

(03) කෝමල ගාන්ධාරය හා කෝමල නිෂාදය යෙදෙන මේලය වනුයේ,
(1) බිලාවල් මේලයයි. (2) කල්‍යාණ මේලයයි.
(3) කාෆි මේලයයි. (4) භෛරවී මේලයයි.

(04) රාගයකට අදාළ වාදී, සංවාදී, ස්වර සංගති, ගායන සමය ආදී ලක්ෂණ ඇතුළත්ව ප්‍රබන්ධ වී ඇත්තේ,
(1) මධ්‍යලය ගීත වේ. (2) සර්ගම් ගීත වේ.
(3) ලක්ෂණ ගීත වේ. (4) ඛ්‍යාල් ගීත වේ.

(05) යමන් රාගයේ විශේෂ ලක්ෂණයකි.
(1) කෝමල ග නි යෙදීම (2) තීව්‍ර මධ්‍යමය යෙදීම
(3) කෝමල ස්වර 4 ම යෙදීම (4) ශුද්ධ ස්වර පමණක් යෙදීම

(06) ස රි ග , රි ග ප , .......... භූපාලි රාගයට අනුව මෙම අභ්‍යාසයේ ඊළඟ පියවර වන්නේ,
(1) ග ම ප (2) ග ප ධ (3) ග ප නි (4) ග ප ස්

(07) / ස රි / ස රි ග / රි ග / රි ග ම / මෙම ප්‍රස්තාරයේ මාත්‍රා බෙදී ඇති ආකාරය අනුව ඊට ගැළපෙන හින්දුස්තානී තාලය වන්නේ,
(1) දීප්චන්දි තාලය (2) දාදරා තාලය
(3) කෙහෙර්වා තාලය (4) ජප් තාලය

(08) රූ රසේ අදිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා.....
ඉහත ගී පාදයේ සැදැස්මත් හා ගීමත් ගණන පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) 26, 28 (2) 28, 26 (3) 25, 26 (4) 25, 28

(09) / ස ස රි රි / ග - ම - / ස රි ග ම / ප ධ ප - /

ඉහත ස්වර පාදය මධ්‍යම භාවයෙන් ලියූ විට ලැබෙන පිළිතුර නම්

(1) / ම ම ප ප / ධ - නි - / ම ප ධ නි / ස් රි් ස් - /

(2) / ම ම ප ප / ධ - <u>නි</u> - / ම ප ධ <u>නි</u> / ස් රි් ස් - /

(3) / ම ම ප ප / <u>ධ</u> - <u>නි</u> - / ම ප ධ නි / ස් රි් ස් - /

(4) / ම ම ප ප / ධ - නි - / ම ප ධ <u>නි</u> / ස් රි් ස් - /

(10) මව්පියෝ ආදී සොඳුරු තමාගේ, සිරි බුද්ධගයා විහාරේ, හරිම් රජ සැපා... යන ගීත ත්‍රිත්වය

(1) මව්පිය ගුණ වරුණ ගීත වේ. (2) ග්‍රාමෆෝන් ගීත වේ.

(3) නව නාට්‍ය ගීත වේ. (4) උපදේශාත්මක ගීත වේ.

(11) |0 |3 |x |2

ඉහත ආකාරයට තාල ස්ථාන යෙදෙන, ත්‍රිතාලයට ගැයෙන මධ්‍යලය ගීතයක, මාත්‍රා 8ක තානාලංකාරයක් ගයා අවසානයේ සමග්‍රහයට වැටීමට නම්, එම තානාලංකාරය ආරම්භ කළ යුතු තාල ස්ථානය වන්නේ,

(1) 0 (2) x (3) 2 (4) 3

(12) කාෆි රාගයේ වාදී, සංවාදී, අනුවාදී, විවාදී ස්වර සියල්ල අන්තර්ගත ස්වර පාදය කුමක් ද?

(1) / රි <u>නි</u> ධ <u>නි</u> / ප ධ ම ප / (2) / රි ප ම ප / <u>ග</u> රි ස - /

(3) / ම ප නි ස් / <u>නි</u> ධ ප - / (4) / රි <u>ග</u> රි ම / <u>ග</u> රි ස - /

(13) පෙ.ව. 6.00 - 9.00 අතර කාලයේ ගැයීමට සුදුසු රාග යුගලයකි.

(1) භූපාලි, බිලාවල් (2) යමන්, භූපාලි (3) බිලාවල්, භෛරවී (4) කාෆි , භූපාලි

(14) සුවඳ සබන් ඇඟ ගාලා..... සෝබාව දේ.... යස ඉසුරු පිරුණු තැනා..... යන ගීත තුන ඇතුළත් නාට්‍ය තුන පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) රතු හැට්ට කාරි, තාරාවෝ ඉගිලෙති, රාජ කපුරු.

(2) තාරාවෝ ඉගිලෙති, රාජ කපුරු, රතු හැට්ට කාරි.

(3) රාජ කපුරු, රතු හැට්ටකාරි, තාරාවෝ ඉගිලෙති.

(4) රාජ කපුරු, තාරාවෝ ඉගිලෙති, රතු හැට්ටකාරි.

(15) එකම මේලයකින් ජනිතවන, එකම වේලාවක දී ගායනයට සුදුසු රාග යුගලය කුමක් ද?

(1) බිලාවල්, භූපාලි (2) යමන්, භූපාලි (3) බිලාවල්, යමන් (4) කාෆි, භූපාලි

(16) "රත්නදීප ජන්ම භූමි..." ගීතය ආරම්භයේ දැක්වෙන අංගය නම්,

(1) Introduction (2) Adlib (3) Interlude (4) Bit

(17) ප්‍රධාන තත මන්ද්‍ර ම ස්වරයට සුසර කරන භාණ්ඩ යුගලයකි.

(1) එස්රාජ්, සිතාර් (2) සිතාර් , වයලීන් (3) එස්රාජ්, ගිටාර් (4) ගිටාර්, වයලින්

(18) ත්‍රිතාලයේ අක්ෂර පමණක් යෙදෙන තවත් තාලයකි.

(1) ජප් (2) කෙහෙර්වා (3) දීප්චන්දි (4) දාදරා

(19) වයලින් පවුලේ විශාලතම භාණ්ඩය කුමක් ද?

(1) වයලින් (2) වියෝලා (3) චෙලෝ (4) ඩබල් බේස්

(20) ජන ගී තනු ඇසුරෙන් නිර්මාණය වූ ගීත නාට්‍යයකි.

(1) පේමතෝ ජායතී සෝකෝ (2) කුණ්ඩලකේශී

(3) දෙපානෝ (4) කුවේණි

(21) මන්ද්‍ර තීව්‍ර මධ්‍යමය , මධ්‍ය ශුද්ධ ගාන්ධාරය, උච්ච කෝමල රිෂභය, මන්ද්‍ර කෝමල නිෂාදය, නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ම්̣ ග රි̱ නි̱̣ (2) ම්̇ ග රි̇ නි̱

(3) ම්̣ ග රි̱ නි̣ (4) ම්̣ ග රි̱̣ නි̣

(22) පොතේ ගුරු, සබේවිදානේ, සූත්‍රධාරී යන චරිත ඇතුළත් රංග සම්ප්‍රදායයන් වන්නේ පිළිවෙළින්,

(1) කෝලම්, සොකරි, නූර්ති (2) කෝලම්, නූර්ති, නාඩගම්

(3) නූර්ති, නාඩගම්, කෝලම් (4) නාඩගම්, කෝලම්, නූර්ති

(23) / ග - ම / ප - ග / ම - ග / රි - - /

ඉහත ස්වර පාදය හා සුසංගත වන ස්වර පාදය තෝරන්න.

(1) / ස - රි / ග - ස / රි - ස / නි - - / (2) / ප - ධ / නි - ධ / ප - ම / ග - - /

(3) /රි - ග / ම - රි / ප - ම / ග - - / (4) / ම - ප / ධ - ම / ප - ම / ග - - /

(24) බමරකු ආවයි නිරිත දිගේයා...., සුවදේ මට සීතල සුළඟ පවා...

යන ගීතවල තනුව තුළින් පිළිබිඹු වන්නේ කුමන රාගයක ඡායාව ද?

(1) බිලාවල් (2) යමන් (3) කාෆි (4) භෛරවි

(25) බිලාවල් රාගයට අයත් තනාලංකාරය තෝරන්න.

(1) / නිස ගම පධ නිස් / නිධ පම ගරි ස - / (2) / සරි ගප ධ - ස් - / ස්ප ධප ගරි ස- /

(3) / ගප ධනි ස්නි ධප / මග මරි සරි ස - / (4) / නිරි ගම පධ නිස් / නිධ පම ගරි ස - /

(26) සාමාජයීය ගී යටතේ ගැනෙන ගීත විශේෂ දෙක වන්නේ,

(1) දරු නැලවිලි ගී, මෙහෙ ගී (2) දරු නැලවිලි ගී, කෙළි ගී

(3) කෙළි ගී, මෙහෙ ගී (4) මෙහෙ ගී . බැති ගී

(27) ගසල් ගායනය සම්බන්ධයෙන් ජනප්‍රිය වූ ශිල්පියෙකි.

(1) අමීර් ඛුස්රු (2) ජග්ජිත් සිං

(3) සකීර් හුසේන් (4) රන්ධීර් රෝයි

(28) සවන් දී පෙර රාම චරිතේ අසව්... මෙම නූර්ති ගීතයේ තනුව නිර්මාණය සඳහා පාදක කොටගෙන ඇති රාගයේ ස්වර සංගතියකි.




(1) ස ධ ස රි ග රි ස (2) රි ප ම ප ගු රි ස

(3) ග රි නි රි ග රි ස (4) ග ප ම ග ම රි ස

(29) එකම ශ්‍රැතියකට අනුව තත් හතර සුසර කළ වයලීන කිහිපයකින්, එකවර සජීවීව ගීතයක් වයන විට, එක් වයලීනයක හඬ සැරට ඇසුනි. ඉන් ගම්‍ය වන්නේ නාදයේ කුමන ගුණය ද?

(1) විපුලතාවය (2) තාරතාවය (3) ධ්වනි ගුණය (4) උච්චනීච භේදය

30 සිට 35 දක්වා ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
|  |  |  |  |

(30) සොකරි ගැමි නාටක ශෛලිය සඳහා යොදාගත් අවනද්ධ භාණ්ඩය දැක්වෙන අක්ෂරය නම්,
(1) A (2) B (3) C (4) D

(31) "B" අක්ෂරය යටතේ ඇති භාණ්ඩය වාදනයට සුදුසු ගීත පාදය තෝරන්න.
(1) පායාලා අඹරේ.... (2) මෝරා බීජයෙනා....
(3) සේවිත පාද සරෝරුහ.... (4) සවන් දී පෙර රාම චරිතේ....

(32) විතත වර්ගයට අයත් භාණ්ඩය දැක්වෙන අක්ෂරය නම්,
(1) B (2) C (3) D (4) A

(33) "බහුබූතයා" චරිතය ඇතුළත් ඇතුළත් රංග ශෛලියේ ද වාදනය කරන තාල වාද්‍ය භාණ්ඩය දැක්වෙන අක්ෂරය වන්නේ,
(1) A (2) B (3) C (4) D

(34) "B" අක්ෂරය යටතේ දැක්වෙන භාණ්ඩය භාවිතා කරන රංග ශෛලිය නම්,
(1) කෝලම් (2) නාඩගම් (3) නූර්ති (4) සොකරි

(35) උකුසා වන්නම ගායනයේ දී යොදාගන්නා තාල වාද්‍ය භාණ්ඩය දැක්වෙන අක්ෂරය තෝරන්න.
(1) C (2) D (3) A (4) B

(36) 
මෙම ප්‍රස්තාරයේ දක්වෙන ස්වර පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කළ විට දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,
(1) / ස̇ - නි ධ / (2) / ගු̣ - ම̣ රි̣ /
(3) / ස̇ - රි̇ නි / (4) / ස̇ රි̇ නි - /

(37) ද්‍රවිඩ අනුකරණයෙන් මිදී ස්වතන්ත්‍ර තනු නිර්මාණයට යොමු වූ, එමෙන් ම චිත්‍රපට සංගීතයට සිංහල ලකුණ තැබූ චිත්‍රපටය වන්නේ,
(1) රේඛාව (2) රන්මුතු දූව (3) ගැටවරයෝ (4) සත් සමුදුර

(38) 60 - 70 දශකයේ ඉන්දීය චිත්‍රපට සංගීතය තුළ අමරණීය නිර්මාණ ඉදිරිපත් කළ සංගීතඥයකු නොවන්නේ,
(1) එස්.ඩී.බර්මන් (2) ශංකර් ජායිකිශන් (3) නෞෂාද් (4) අමීර් ඛුස්රු

(39) සංගීතය හදාරන ශිෂ්‍යයකුට බොහෝ තොරතුරු ලබාගත හැකි වෙබ් අඩවියකි.
(1) Encarta (2) you tube (3) MiDi (4) e - learning

(40) $B^b$ Major chord එකට අයත් ස්වර වන්නේ,
(1) නි රි̲ ග (2) නි̲ ස ම (3) නි̲ රි ම (4) නි රි ම

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

◆ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) අංක (i) සිට (iv) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(i) නි̣ ස ගු̣ ම ප ධු̣ ප ... යනු කුමන රාගයකට අයත් ස්වර සංගතියක් ද?

(ii) ස රි ග රි ග ස , රි ග ම ග ම රි... යනුවෙන් යෙදෙන ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවරට අයත් ස්වර ඛණ්ඩය ලියන්න.

(iii) "රැගත් සුරා පිරූ විතින්..." යන පැදි ඛණ්ඩය අයත් කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

(iv) මාත්‍රා තුනක වටිනාකම දැක්වීමට බටහිර සංගීතයේ යොදන සංකේතය කුමක් ද?

අංක (v) සිට (viii) තෙක් හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟ ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(v) "තාන තනා තන තම්දෙනා,." යනුවෙන් ආරම්භවන වන්නම ගායනයේ දී තාලය වැයීමට සුදුසු අවනද්ධ භාණ්ඩය ............................... යි.

(vi) "ජන සංගීත සිද්ධාන්ත" ග්‍රන්ථයේ කතුවරයා වන්නේ ............................... සූරීන් ය.

(vii) රකිනු ඊශ්වරා.... නම් නූර්ති ගීතයේ තනුව ............................... රාගය ඇසුරින් නිර්මාණය වී ඇත.

(viii) ගමට කලින් හිරු.... ගීතය ගායනා කරනු ලබන්නේ ............................... මහතා ය.

පහත වගුවේ අංක (ix) හා (x) ප්‍රශ්නවල පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(සරත් දසනායක , තාරාවෝ ඉගිලෙති, එක්ටැම් ගේ, ගුණදාස කපුගේ)

| චිත්‍රපට / නාට්‍ය ගීතය | චිත්‍රපටයේ / නාට්‍යයේ නම | සංගීත අධ්‍යක්ෂණය |
|---|---|---|
| ix උන්මාද සිතුවම්.... | ............................... | ............................... |
| x සෝබාව දේ.... | ............................... | ............................... |

(ලකුණු 12)

(02) පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග හතරක ලක්ෂණ දැක්වෙන වගන්ති හතරකි.

A - එක් විකෘති ස්වරයක් පමණක් යෙදෙන අතර සවස 6.00 - 9.00 අතර කාලයේ ගායනයට සුදුසු ය.

B - ස්වර 12ම යොදාගත හැකි අතර දිනයේ ඕනෑම වේලාවක ගායනයට සුදුසු ය.

C - ස්වර දෙකක් විකෘති වන අතර මධ්‍යම රාත්‍රියේ දී ගායනයට සුදුසු ය.

D - ස්වර දෙකක් වර්ජිත වන අතර රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගායනයට සුදුසු ය.

(i) ඉහත A, B, C, D අක්ෂර යටතේ දක්වා ඇති වගන්තිවලින් විස්තර කරන රාග නම් කරන්න. (ලකුණු 04)

(ii) A හා D අක්ෂර යටතේ දක්වා ඇති රාග දෙකේ වාදී සංවාදී ස්වර ලියන්න. (ලකුණු 02)

(iii) B හා C අක්ෂර යටතේ දැක්වෙන රාග දෙකෙන් එක් රාගයකට අයත් මධ්‍යලය ගීතයක හෝ ලක්ෂණ ගීතයක හෝ වාදිතයක අන්තරා කොටසක් ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iv) නිර්දේශිත වෙනත් රාගයකට අයත් මාත්‍රා 8ක තානාලංකාරයක් ලියා දක්වන්න. (ලකුණු 02)

(03) නිර්දේශිත රාග තුනකට අයත් ස්වර ස්ථාපන ගීත තුනක පළමු පාදයේ ස්වර පහත දැක්වේ.

A - ග ම රි , ග ප ධ නි , ස නි ධ , ප ප ග ප

B - ස රි ග , රි ස ස, ධ ධ ස , රි ග -

C - ස ස රි රි , ගු ගු ම ම , ප ධ ම ප , ගු - රි -

(i) ඉහත අක්ෂර යටතේ දක්වා ඇති ස්වරපාද අයත් රාග නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉහත දක්වෙන ස්වර පාදවලට අදාළ ගීත ගැයෙන තාල තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) එම තාල අතරින්, තාලයේ විභාගවල යෙදෙන මාත්‍රා අසමාන වන තාලය ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iv) පහත වගුවේ දැක්වෙන අක්ෂර දෙක ඉපදීමට දායාවෙන් හා බායාවෙන් වාදනය කළ යුතු අක්ෂර අදාල ස්ථානවල ලියා වගුව සම්පූර්ණ කරන්න.

| අක්ෂරය | දායාවෙන් උපදින අක්ෂරය | බායාවෙන් උපදින අක්ෂරය |
|---|---|---|
| ධ | ........................................ | ........................................ |
| ධිං | ........................................ | ........................................ |

(ලකුණු 02)

(04) A - ඇහැල මලින් ගස් පිරිලා... B - අඹ දඹ නාරං කෙසෙල් දෙල්...

C - පායාලා අඹරේ... D - වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ....

(i) ඉහත A B C D අක්ෂර යටතේ දක්වා ඇති ගී පාද අයත් රංග ශෛලීන් හතර නම් කරන්න. (ලකුණු 04)

(ii) B අක්ෂරය යටතේ ඇති ගීතය අයත් රංග ශෛලියේ සංගීතමය ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) වෙදා නටන්නේ.... ගීතය අයත් රංග ශෛලියේ සංගීතය පිළිබඳ කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(iv) පැරණි නාඩගම් ගී තනු ඇසුරින් නිර්මාණය වූ නවනාට්‍ය ගීත දෙකක මුල් පාද පහත වගුවේ පළමු කොටුවේ ලියා ඊට අදාළව අනෙකුත් තොරතුරු දී ඇති මාතෘකා අනුව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

| ගීතය | නව නාට්‍යයේ නම | ආභාෂය ලබා ඇති නාඩගම් ගීතය | නාඩගමේ නම |
|---|---|---|---|
| | | | |
| | | | |

(05) ගීත වර්ග කිහිපයකට අදාළ කරුණු අක්‍රමවත් ලෙස ඇතුළත් වූ වගුවක් පහත දක්වේ.

| ගීත වර්ගය | ගීතය | ගායනය |
|---|---|---|
| ග්‍රැමෆෝන් ගී | ඕලු පිපීලා, විල ළෙල දෙනවා. | ෆ්‍රෙඩී සිල්වා මහතා |
| ගුවන් විදුලි සරල ගී | සිනිඳු සුදු මුතු තලාවේ... | ලක්ෂ්මි බායි මහත්මිය |
| චිත්‍රපට ගී | පාන්කිරිත්තා තක්කිට තරිකිට | සුනිල් සාන්ත මහතා |
| උපදේශාත්මක ගී | පිට දීප දේශ ජයගත්තා | ඩබ්.ඩී.අමරදේව මහතා |

(i) ඉහත වගුවේ එක් එක් ගීත වර්ගය පිළිතුරු පත්‍රයේ ලියා ඊට ගැලපෙන අනෙකුත් තොරතුරු ඒ ඉදිරියෙන් නිවැරදි ලෙස තීරුගත කරන්න. (ලකුණු 04)

(ii) ගුවන් විදුලි සරල ගීතවල ආරම්භක යුගයේ තිබූ ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ඉහත වගුවේ දැක්වෙන සත්සමුදුර චිත්‍රපටයේ තේමා ගීතය පිළිබඳ සංගීතමය තොරතුරු හතරක් ලියන්න. (ලකුණු 04)

(06) (i) පහත දැක්වෙන රුක් සටහනේ ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු යන මාතෘකාව යටතේ දී ඇති හිස්තැන් සම්පූර්ණ කර එක් එක් ගී වර්ගයට උදාහරණ ලෙස ගීත පාද දෙක බැගින් ලියා දක්වන්න.

<u>නිර්මාණයට පදනම් වූ හේතු</u>

ගැමි ගී
- අ) වෘත්තින් (මෙහෙ ගී) උදා :..............................
..............................
- ඉ) .............................. (ඇදහිලි ගී) උදා :..............................
..............................
- උ) .............................. (සමාජයීය ගී) උදා :..............................
..............................

(ලකුණු 04)

(ii) ගැමි ගීයක හා සෙ ගීයක පළමු පාදය බැගින් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iii) ඩබ්.බී.මකුලොලුව/ රෝහණ බැද්දගේ / ලයනල් රන්වල යන මහතුන්ගෙන් එක් අයකු විසින් ශ්‍රී ලාංකික ජන සංගීතයට සිදු කළ සේවය පිළිබඳ කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

(07) / ග ස ග / ප + + / ම ම ධ / ප - - /

/ ප නි රි̇ / ස̇ - - - / - ප ග / ස - - /

(i) ඉහත දක්වා ඇති ස්වර ප්‍රස්තාරය බටහිර සංගීතයට අනුව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(ii) එහි පළමු පාදයේ විභාග 4ට ගැළපෙන chords ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ඉහත දක්වා ඇති ස්වර පාද දෙක මධ්‍යම භාවයෙන් නැවත ප්‍රස්තාර කරන්න. (ලකුණු 02)

(iv) සංධ්වනියක ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)